## WEATHER FORECAST FOR 10th DECEMBER 2018
## (Issued at 1200 noon on 09th December 2018)

**The low pressure area still persists to the South-east of Sri Lanka in the Bay of Bengal.**
Showers or thundershowers will occur at times in Eastern, Uva and Central provinces and in Hambantota and Polonnaruwa districts.
Fairly heavy falls above 75mm can be expected at some places in Eastern and Uva provinces.

Fairly strong gusty winds at times up to 40 kmph can be expected over the island.

**There may be temporary localized strong winds during thundershowers. General public is kindly requested to take adequate precautions to minimize damages caused by lightning activity.**

බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පවතින අඩු පීඩන කලාපය තවදුරටත් දිවයිනට ගිනිකොණ දෙසින් පවතී.

නැගෙනහිර, ඌව සහ මධ්‍යම පළාත්වලත් හම්බන්තොට සහ පොලොන්නරුව දිස්ත්‍රික්කවලත් විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

නැගෙනහිර සහ ඌව පළාත්වල ඇතැම් ස්ථාන වලට මි. මී. 75 ට වැඩි තරමක තද වැසි ඇති විය හැක.

දිවයින හරහා විටින් විට හමන පැ.කි.මී. 40 දක්වා වන තරමක් තද සුළං ඇති විය හැක.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැක. අකුණු මඟින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS (Issued at 1200 noon on 09th December 2018)

The low pressure area still persists to the South-east of Sri Lanka in the Bay of Bengal. Under the influence of the system the possibility for heavy rainfalls, sudden roughness associated with sudden increase of wind speed (up to 70-80 kmph) in the deep sea areas off the coast extending from Hambantota to Batticaloa via Pottuvil is high.
**Naval and fishing communities are requested to be vigilant in this regards.**

Showers or thundershowers will occur at times in the sea area extending from Hambanthota to Trincomalee via Pottuvil. Heavy showers can be expected at some places in the above sea areas.

Showers or thundershowers may occur at few places in the sea areas extending from Colombo to Hambanthota via Galle during evening or night.
Winds will be North-easterly in the sea areas around the island and wind speed will be 30-40 kmph.

Sea areas off the coast extending from Kaluthara to Mannar via Puttalam and in the deep sea areas to the east of the island can be rough at times as the wind speed can increase up to 50-60 kmph.

**Temporarily strong gusty winds and rough seas can be expected during thundershowers.**

## ඉදිරි පැය 24 සඳහා දිවයින වටා ඇති මුහුදේ කාලගුණ තත්ත්වය.
## 2018 දෙසැම්බර් මස 09 දින මධ්‍යහන 1200 ට නිකුත් කරන ලදි.

බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පවතින අඩු පීඩන කලාපය තවදුරටත් දිවයිනට ගිනිකොණ දෙසින් පවතී. ඒ හේතුවෙන් හම්බන්තොට සිට පොතුවිල් හරහා මඩකලපුව දක්වා වෙරළට ඔබ්බෙන් වන ගැඹුරු මුහුදු ප්‍රදේශවල තද වැසි සහ සුළං වේගය ක්ෂණිකව (පැ.කි.මී. 70-80 පමණ) ඉහළ යාමට ඉඩ ඇති හෙයින් එම මුහුදු ප්‍රදේශ ක්ෂණිකව රළු වීමට වැඩි හැකියාවක් පවතී.
ධීවර සහ නාවුක ප්‍රජාවට මේ පිලිබඳව අවධානයෙන් කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ.

හම්බන්තොට සිට පොතුවිල් හරහා ත්‍රිකුණාමලය දක්වා වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවන අතර ඇතැම් ස්ථාන වලට තද වැසිද ඇතිවිය හැක.

කොළඹ සිට ගාල්ල හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශවල ස්ථාන ස්වල්පයක සවස් කාලයේදී හෝ රාත්‍රි කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක.

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං ඊසාන දිශාවෙන් හමන අතර සුළඟේ වේගය පැ.කි.මී. 30-40 පමණ වේ.

කළුතර සිට පුත්තලම හරහා මන්නාරම දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සහ දිවයිනට නැගෙනහිර දෙසින් වන ගැඹුරු මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට පැ.කි.මී. 50-60 දක්වා වැඩි විය හැකි අතර එවිට, එම මුහුදු ප්‍රදේශ රළු විය හැක.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව රළු විය හැක.

කාලගුණ විද්‍යාඥ (Duty Meteorologist),
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology)

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2018/12/09
Time : 12:20 hrs
8
D (Ops)/DG/ADO